**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2020 වර්ෂයේ පළමු කාර්තුව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk

................................................................................................................

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 පළමු කාර්තුව (ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

කෝවිඩ්-19 වසංගතය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් ලෝක ආර්ථිකය පසුබෑමේ ප්‍රවණතාවයත් සමඟ, 2020 පළමු කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද පසුබෑමට ලක් වූ අතර සේවා අංශය පමණක් තවදුරටත් සියයට 3.1 කින් අඛණ්ඩව වර්ධනය වී ඇත. ආර්ථිකයේ ඉතිරි අංශ තුන වන 'කෘෂිකාර්මික', 'කර්මාන්ත' සහ 'භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකළ බදු' සෘණ වර්ධන වේග වාර්තා කරමින් සමස්ත ආර්ථිකයේ පසුබෑමක් වාර්තා කර ඇත. කෝවිඩ්-19 වසංගතය මෙම කාර්තුවේ දී අහිතකර ලෙස බලපෑමත් සමඟ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද උදාවීමට පෙර උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙම කාර්තුවේදී රට අක්‍රිය වීම හේතුවෙන් උපරිම මට්ටමින් ක්‍රියාත්මක වීමට අපොහොසත් විය. එසේ ම , 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිදුවූ පාස්කු ප්‍රහාරය ආර්ථිකයේ අංශ කිහිපයකට දිගින් දිගටම අහිතකර ලෙස බලපා තිබූ අතර එමගින් එම අංශවල වර්ධන අපේක්ෂාවන් යථා තත්ත්වයට පත් නොවීම මෙම කාර්තුවේ ආර්ථික පසුබෑමට තවදුරටත් දායක විය.

සාමාන්‍යයෙන්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම කාර්තුවකම ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරනුයේ එක් එක් කාර්තුව අවසන් වී දින 75 කට පසුවය. එම දිනයන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඉදිරි දත්ත මුදාහැරීමේ දින සටහනෙහි (ADRC) ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය 2020 ජූනි 19 වන දින නිකුත් කළ යුතුව තිබුණි. එසේවුවත්, මෙම වසරේදී, කෝවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන්, පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම සඳහා දිවයිනේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන ආවරණය කරමින් මැයි සහ ජූනි මාසවලදී අවශ්‍ය දත්ත සහ තොරතුරු එක්රැස් කිරීමේදී බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. කෝවිඩ් 19 වසංගත තත්ත්වය මර්ධනය කිරීමට රජය ගෙන තිබූ ක්‍රියාමාර්ග සහ උපදෙස් අනුව කාර්යාලවලට නිළධාරීන් ගෙන්වා ගැනීම සීමා කිරීමට සිදුවූ බැවින් දත්ත ලබා ගැනීමට ප්‍රමාද වීමත්, දත්ත වල ගුණාත්මකභාවය පිළිබඳ ව ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමටත් සිදුවිය. ඒ හේතුවෙන් ලැබී තිබූ දත්තවල යෝග්‍යතාවය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය නිකුත් කිරීමේ දිනය සති කිහිපයකින් කල් දැමීමට සිදුවිය.

2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිදුවූ පාස්කු ප්‍රහාරයේ අහිතකර බලපෑම් හේතුවෙන් මන්දගාමීව පැවති ආර්ථික කටයුතු බොහොමයක එම අහිතකර තත්වය, 'කෝවිඩ් - 19 වසංගතය' ආරම්භයේ සිට තවදුරටත් වර්ධනය වීම හේතුවෙන් සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද උදාවීමට පෙර සාමාන්‍යයෙන් අත්පත් කර ගනු ලබන උපරිම නිමැවුම් තත්වයන්ට ළඟා වීමට අපොහොසත් වීම 2020 පළමු කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු මගින් ඍණාත්මක වර්ධනයක් පිළිබිඹු වීමට බලපා ඇත. කොවිඩ් -19 වසංගතයේ අහිතකර බලපෑම මේ වසරේ මාර්තු මස මුල සිට ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වෙමින් පැවති බැවින් 2020 දෙවන කාර්තුවේදී මෙම තත්වය වැඩි තීව්‍රතාවයකින් යුතුව ආර්ථිකයට දැනීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, වසංගතයේ ගෝලීය බලපෑම් 2019 වර්ෂයේ අවසාන කාර්තුවේ සිට අත්විඳ ඇති අතර, එය ශ්‍රී ලංකාවට බලපාන්නට බොහෝ කලකට පෙර ලෝකයේ ආර්ථික අතින් වැදගත් කලාපවලට බලපෑවේය. එම නිසා, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ගෝලීය ඉල්ලුමේ අඩුවීමක් සහ ප්‍රධාන වශයෙන් චීනයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රමාද වීම සහ රජයන් විසින් පනවා ඇති සංචාරක තහනම හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීමේ අඩු වීමක් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ බොහෝ අංශවල විශේෂයෙන්, නිෂ්පාදනය, ඉදිකිරීම්, ප්‍රවාහන හා සංචාරක කර්මාන්තවලට ද අහිතකර ලෙස බලපා ඇත.

ආර්ථික විශේෂඥයින් විසින් මෙය 2001 ලෝක ආර්ථික අවපාතයෙන් පසු ඇති වූ දරුණුතම ආර්ථික කම්පනය ලෙස හඳුන්වා දී ඇත. කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් ලොව පුරා බොහෝ ආර්ථිකයන් ද මේ වනවිට පසුබෑමට ලක්වී ඇත. 2020 පළමු කාර්තුවේදී, ශ්‍රී ලංකාව ද මෙම දුෂ්කර තත්වයට මුහුණදෙමින් කාර්තුමය ආර්ථික වර්ධනය සියයට ඍණ 1.6ක් ලෙස වාර්තා කර ඇත. ඒ අනුව, කොවිඩ් -19 වසංගතය පැතිරීම ආර්ථිකයේ බොහෝ අංශවල, නිෂ්පාදන, ඉදිකිරීම්, මගී ප්‍රවාහනය (ගොඩබිම සහ ගුවන්), පතල් හා කැණීම්, සංචාරක, සිල්ලර වෙළඳාම මෙන්ම මසුන් ඇල්ලීම වැනි කෘෂිකර්මාන්තයේ සමහර ක්‍රියාකාරකම් කෙරෙහි ද අනපේක්ෂිත ලෙස බලපා ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන පරිදි 2020 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,292,589 කි. තව ද පසුගිය වසරේ පළමු කාර්තුවේ දී මෙම අගය රුපියල් මිලියන 2,330,053 ක් විය. එසේම 2020 පළමු කාර්තුව සඳහා පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,845,900 ක් වන අතර පසුගිය වසරේ පළමු කාර්තුවේ දී මෙම අගය රුපියල් මිලියන 3,773,551 ක් ලෙස වාර්තා වී ඇති අතර ඒ අනුව පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 1.9 ක සුළු ඉහළ යෑමක් වාර්තා කර ඇත.

2019 පළමු කාර්තුව, සාපේක්ෂ වශයෙන් ශක්තිමත් කාර්තුවක් වන අතර එහි වර්ධන වේගය සියයට 3.7 කි. 2019 පළමු කාර්තුව තුල දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේදී එක් එක් ආර්ථික කටයුතු වල එකතු කළ අගය ගණනය සඳහා දළ වශයෙන් වැඩ කරන දින 90 ක් ආවරණය වී ඇත. කෙසේ වෙතත්, 2020 වසරේ පළමු කාර්තුවේ අවසාන සති දෙක (මාර්තු 20 සිට මාර්තු 31 දක්වා) තුළ දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් මුළු රටම වසාදැමීමට සිදු වූ අතර අත්‍යවශ්‍ය සේවා කිහිපයක් හැරුණු විට පෙර වසරේදී මෙන් සම්පූර්ණ කාර්තුව තුලම ආර්ථික ක්‍රියාකාරකම් සක්‍රිය නොවිය.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු 2020 වර්ෂයේ පළමු කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය පිළිවෙලින් සියයට 7.3 ක්, සියයට 28.4 ක්, සියයට 58.3 ක් සහ සියයට 6.0 ක් ලෙස වාර්තා වේ.

කෝවිඩ් - 19 වසංගතය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ බොහෝ අංශ විශාල වශයෙන් පසුබෑමට ලක් වූ අතර, එය රටේ ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීමට බලපෑවේය. ඒ අනුව, 2020 පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු අනුව කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවල සෘණ ආර්ථික වර්ධන වේගයන් පිළිවෙලින් සියයට 5.6 ක් සහ සියයට 7.8 ක් ලෙස වාර්තා වී තිබේ. කෙසේ වෙතත්, පළමු කාර්තුව තුළ සේවා කටයුතු සියයට 3.1 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.

**කෘෂිකාර්මික ආර්ථික කටයුතු**

පසුගිය වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් "කරදිය ධීවර කටයුතු" (සියයට 8.1ක) , "පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව" (සියයට 12.8ක) , "තේ වගා කිරීම"( සියයට 27.5 ක) , "රබර් වගා කිරීම"( සියයට 8.7ක ) හා "වන වගාව හා දැව කැපීම "( සියයට 13.3ක ) යන ආර්ථික කටයුතු බලපා ඇත. එසේ වුවද, "වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම" (සියයට 12.9 ක), "වී වගා කිරීම"( සියයට 4.1ක) , "එළවළු වගා කිරීම" (සියයට 5.0ක), "පළතුරු වගා කිරීම" (සියයට 7.4ක), "කුළුබඩු වගා කිරීම" (සියයට 1.5ක) හා "සත්ව නිෂ්පාදන" (සියයට 0.4 ක) මෙම කාර්තුවේදී ද තවදුරටත් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**කර්මාන්ත ආර්ථික කටයුතු**

2020 වර්ෂයේ පළමු කාර්තුවේදී, කෝවිඩ් - 19 වසංගතය ව්‍යාප්ත වීම හේතුවෙන් සමස්ත කාර්මික ක්‍රියාකාරකම් සියයට 7.8 ක පසුබෑස්මක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළම දායකත්වය දරණ නිමැවුම් කර්මාන්තයේ ද 2020 පළමු කාර්තුවේදී සියයට 4.1 ක ඉහළ පසුබෑස්මක් වාර්තා විය. ඇඟලුම්, තේ සහ රබර් නිෂ්පාදන සඳහා එක්සත් ජනපදයෙන් හා යුරෝපයෙන් අපනයන ඉල්ලුම අඩුවීම, මාර්තු මස අවසාන සති දෙකේ සිට දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය පැනවීම සහ චීනයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් නිෂ්පාදනය නතර කිරීම මෙයට හේතු විය. නිමැවුම් කර්මාන්තයේ සෘණ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ " රෙදිපිළි, ඇඟලුම් නිෂ්පාදනය හා සම් ආශ්‍රිත නිෂ්පාදන" ක්‍රියාකාරකම් මෙම කාර්තුවේදී සියයට 13.6 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කිරීමයි. ඊට අමතරව, "පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන" (සියයට 19.2ක), "රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන" (සියයට 11.6ක) සහ " රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන හා මූලික ඖෂධ නිෂ්පාදනය" (සියයට 10.1 ක) සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර, රටේ කාර්මික අංශයට ඉහළම දායකත්වය සපයන "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන" ක්‍රියාකාරකම් 2020 පළමු කාර්තුවේදී සියයට 2.8 ක ධන වර්ධන වේගයක් වාර්තා කර තිබේ.

කර්මාන්ත අංශයේ සියයට 6.4 ක දායකත්වයක් දක්වන "ඉදිකිරීම් කර්මාන්තය" මෙම කාර්තුවේදී සියයට 16.0 ක පසුබෑස්මක් වාර්තා කර ඇති අතර එම කර්මාන්තය කොවිඩ් - 19 වසංගතයේ විශාල බලපෑමකට ලක් වී ඇති බවක් පෙන්නුම් කරයි. ඉදිකිරීම් කටයුතුවල පහත වැටීම හේතුවෙන්, 2020 පළමු කාර්තුවේදී "පතල් හා කැණීම්" කර්මාන්තයේ ආර්ථික වර්ධන වේගය සියයට සෘණ 18.3 ක් ලෙස සටහන් විය. මේ අතර, "විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සැකසුම් සැපයුම"( සියයට 2.3 ක) සහ "ජලය එකතු කිරීම, පිරිපහදු කිරීම සහ සැපයීම"(සියයට 5.0 ක) යන ආර්ථික කටයුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

**සේවා ආර්ථික කටයුතු**

2020 පළමු කාර්තුව තුළ සේවා අංශයේ ආර්ථික වර්ධනය බෙහෙවින් සතුටුදායක විය. වසංගතය මධ්‍යයේ වුවද මෙම අංශය සියයට 3.1ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. "තොග හා සිල්ලර වෙළඳාම"(සියයට 4.1ක), "විදුලි සංදේශ සේවා" (සියයට 15.2ක) , "තොරතුරු තාක්ෂණ සේවා" (සියයට 9.6ක), "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා" (සියයට 9.0ක) හා " අනෙකුත් පෞද්ගලික සේවා"( සියයට 3.4 ක) 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඉහළ ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. මෙම

කාර්තුව තුල කෝවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම හේතුවෙන්, “ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම”( සියයට 6.2 ක) හා “ප්‍රවාහනය” (සියයට 0.1ක) යන ආර්ථික ක්‍රියාකාරකම් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2020 පළමු කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk (http://203.94.94.89/mainsite/NationalAccounts/StaticalInformation) වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇත.

ආචාර්ය අයි. ආර්. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්